# දෙවියන්වහන්සේගේ ගැළවීමේ  සැලැස්ම

**1යොහාන්5:11, 12**

ඒ සාක්ෂිය නම් දෙවියන්වහන්සේ අපට සදාකාල ජීවනය දුන් බවය, ඒ ජීවනයද තමන් පුත්‍රයාණන් තුල තිබේ. පුත්‍රයාණන්වහන්සේ ඇත්තාට ඒ ජීවනයඇත. දෙවියන්වහන්සේගේ පුත්‍රයා නැත්තාට ඒ ජීවනය නැත. මෙම ඡේදය අපට කියන්නේ දෙවියන්වහන්සේ අපට සදාකාල ජීවනය දී ඇති බවය. මෙම ජීවනය ඇත්තේ

උන්වහන්සේගේ පුත්‍ර යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුලය. වෙනත් වචනවලින්, සදාකාල ජීවනය උරුමකර ගැනීමට ඇති මාර්ගය දෙවියන්වහන්සේගේ  පුත්‍රයා උරුම කරගැනීමය.

ප්‍රශ්නය වන්නේ, පුද්ගලයෙකුට දෙවියන්වහන්සේගේ පුත්‍රයා ලබාගන්නේ කෙසේද? යන්නය.

**මනුෂ්‍යයාගේ ගැටළුව**

**දෙවියන්වහන්සේගෙන් වෙන්වීම**

**යෙසායා59:2**

නුමුත් නුඹලාගේ අපරාධම නුඹලා සහ දෙවියන්වහන්සේ අතරේ වෙන්වීමක් කළේය. උන්වහන්සේ නොඅසන ලෙස නුඹලාගේ පාපද උන්වහන්සේගේ මුහුණ නුඹලාගෙන් සැඟෙවුවේය.

**රෝම5:8**

නුමුත් දෙවියන්වහන්සේගේ අප කෙරෙහි ඇති තමන්වහන්සේගේ ප්‍රේමය පෙන්වන්නේ අප පව් කාරයන්ව සිටියදීම අප වෙනුවට ක්‍රිස්තුස්වහන්සේ මරණය විඳීමෙන්ය.

රෝම 5:8ට අනුව දෙවියන්වහන්සේ අප සඳහා උන්වහන්සේගේම ප්‍රේමය  උන්වහන්සේගේ  පුත්‍රයාගේ මරණය තුලින් අපට පෙන්වූ බවය. ක්‍රිස්තුස්වහන්සේට අප වෙනුවෙන් මැරෙන්න සිද්ධවුනේ ඇයි? සියලුම මිනිසුන් පව්කාර නිසා බව ශුද්ධ ලියවිල්ල ප්‍රකාශ කරයි. "පාපය" කියන්නේ  සලකුණ නැතිවීමයි. බයිබලය, සියල්ලෝම පව් කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති. (රෝම3:23) යයි ප්‍රකාශ කරයි. වෙනත් වචන වලින් අපේ පාපය සම්පූර්ණ ශුද්ධකම(ධර්මිෂ්ඨකම හා සාධාරණත්වය) ඇති දෙවියන්වහන්සේගෙන්  අප වෙන් කරයි. එමනිසා පව්කාර මනුෂ්‍යයා දෙවියන්වහන්සේ විසින්  විනිෂ්චය කළයුතුය.




**හබක්කුක්1:13** නපුර බලන්ට බැරි තරම් පවිත්‍ර ඇස් ඇත්තාවූ, හිංසාව බලාසිටින්ට නොහැකි ඔබවහන්සේ ද්‍රෝහීන් දෙස බලාසිටින්නෙත්,

**අපේ ක්‍රියාවල නිෂ්ඵල භාවය**

ශුද්ධ ලියවිල්ල, මනුෂ්‍ය යහපත්කම්වත් ක්‍රියාවන්වත් මනුෂ්‍ය සදාචාරයවත් ආගමික ක්‍රියාකාරකම්වල වත් ප්‍රමාණයකින් දෙවියන්වහන්සේගේ පිළිගැනීම ඇතිකර ගැනීමට හෝ කිසිවෙකුට ස්වර්ගයට යාමටවත් පුළුවන්කමක් නැති බව කියයි.

සදාචාරවත් මිනිසා, සදාචාරවත් නොවන මිනිසා, ආගමික මිනිසා, ආගමික නොවන මිනිසා යන සියලුදෙනාම ඇත්තේ එකම බෝට්ටුවේය. ඔවුන් සියලුදෙනා දෙවියන්වහන්සේගේ සම්පූර්ණ ධර්මිෂ්ඨකමෙන් හීනව සිටිති. සදාචාරවත් මිනිසා ගැන සාකච්චා කිරීමෙන් පසු ප්‍රේරිතවූ පාවුල් මෙසේ ප්‍රකාශ කරයි.

එසේ වීනම් කිමෙක්ද? අපි ඔවුන්ට අඩු තත්වයක්ද? කිසිසේත් නැත. මක්නිසාද යුදෙව්වරුද ග්‍රීක්වරුද යන සියල්ලෝ පාපයට යටත්ව සිටිතියි කියා අපි පළමු දොස්තැබුවෙමුව.

ඒ ගැන මෙසේ ලියා තිබේ. "ධර්මිෂ්ඨ කෙනෙක් නැත, එසේය, එක් කෙනෙක්වත් නැත,"(රෝම3:9,10).

ශුද්ධ ලියවිල්ලෙහි පහතසඳහන් පද මෙයට එක් කරගත හැකි ප්‍රකාශනයන්ය:

**එපීස2:8-9**

මක්නිසාද ඇදහිල්ල කරණකොට ගෙන ඒ අනුග්‍රහයෙන් නුඹලා ගැළවී සිටින්නහුය, එය නුඹලාගෙන්ම නොව දෙවියන්වහන්සේගේ දීමනාවය. කිසිවෙක් පාරට්ටු කරනොගන්න පිණිස ඒක ක්‍රියා වලින් නොවේ.

**තීතස්3:5-7**

අප විසින්ම කළාවූ ධර්මිෂ්ඨකමේ ක්‍රියා වලින් නොව තමන්වහන්සේගේ දයාව ලෙස නැවත ඉපදීම නැමති සේදීමෙන්ද ශුද්ධාත්මයාණන්ගේ අළුත් කිරීමෙන්ද උන්වහන්සේ අප ගැළවූ සේක.

එසේය, උන්වහන්සේගේ කරුණාවෙන් අප ධර්මිෂ්ඨ කරනුලැබ, සදාකාල ජීවනයේ බලාපොරොත්තුවේ හැටියට උරුමක්කාරයන් වන පිණිස, උන්වහන්සේ අපගේ ගැළවුම්කාරයාණන්වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොට ගෙන ශුද්ධාත්මය අධික ලෙස අප පිට වැගිරෙව් සේක.

**රෝම4:1-5**

එසේවී නම් අපේ මුල් පියවූ ආබ්‍රහම්ට කුමක් ලැබුනේ යයි කියමුද?

මක්නිසාද ආබ්‍රහම් ක්‍රියා කරණකොට ගෙන ධර්මිෂ්ඨ කරන ලද්දේවී නම්, ඔහුට පාරට්ටුකරගැනීමට කාරණයක් ඇත, නුමුත් දෙවියන්වහන්සේ ඉදිරියෙහි නොවේය. මක්නිසාද ලියවිල්ලේ කුමක් කියා තිබේද? ආබ්‍රහම් දෙවියන්වහන්සේ විශ්වාස කළේය, එය ඔහුට ධර්මිෂ්ඨකම කොට ගණන් ගන්නා ලද්දේය කියාය.

ඉදින් වැඩ කරන්නාට කුලිය ණයක් වශයෙන් මිස කරුණාවක් වශයෙන් ගණන් ගනු නොලැබේ. නුමුත් වැඩ නොකරන්නාවූ අභක්තිකයන් ධර්මිෂ්ඨ කොට ගණන්ගන්න තැනන්වහන්සේ කෙරෙහි අදහන්නාවූ අයට ඔහුගේ ඒ ඇදහිල්ල ධර්මිෂ්ඨකම කොට ගණන් ගනු ලැබේ.




දෙවියන්වහන්සේ යහපත් තරම් මනුෂ්‍යයාගේ යහපත්කම් ප්‍රමාණයක් ඇත්තේ නැත. මේ නිසා හබක්කුක් 1:13 අපට : හරි ධර්මිෂ්ඨකමක් නැති කිසිවෙකු සමඟ දෙවියන්වහන්සේට සහභාගිකමක් පවත්වාගැනීමට නොහැකි බව කියයි. දෙවියන්වහන්සේ විසින් පිළිගනු ලැබීමට නම්, අප දෙවියන්වහන්සේ තරම් යහපත් විය යුතුය.

දෙවියන්වහන්සේ ඉදිරියේ අප සියලු දෙනාම අපම විසින් නිරුවත්ව, කරකියාගත දෙයක් නැතිව, බලාපොරොත්තුවක් නැතිව සිටගන්නේය. අපට සවර්ගයට නැගීමට හෝ සදාකාල ජීවනය දෙනු ලැබීමට යහපත්ව ජීවත්වීමේ ප්‍රමාණයක් ඇත්තේ නැත. එසේනම් විසඳුම කුමක්ද?

**දෙවියන්වහන්සේගේ විසඳුම**

දෙවියන්වහන්සේ සම්පුර්ණ ශුද්ධකම පමණක් නොව,( අපේම හෝ අපේ ක්‍රියා මගින් කිසිවිටෙක ලැබිය නොහැකි), උන්වහන්සේ සම්පුර්ණ ප්‍රේමයය, කරුණාව හා දයාවෙන් පුර්ණය. උන්වහන්සේගේ ප්‍රේමය හා අනුග්‍රය නිසා , උන්වහන්සේ අපට බලාපොරොත්තුවක් නැතිව අරින්නේ නැත.

**රෝම5:8**

නුමුත් දෙවියන්වහන්සේගේ අප කෙරෙහි ඇති තමන්වහන්සේගේ ප්‍රේමය පෙන්වන්නේ අප පව්කාරයන්ව සිටියදීම අප වෙනුවට ක්‍රිස්තුස්වහන්සේ මරණය විඳීමෙන්ය.

බයිබලයේ සුභආරංචිය මෙයයි . ශුභාරංචියේ පනිවිඩයයි. එය මනුෂ්‍යයා බවට පත්වු (දෙවියන්වහන්සේ-මනුෂ්‍යයා) පාපයෙන් තොර ජීවිතයක් ගත කර, අපේ පාප වෙනුවෙන් කුරුසිය මත මැරී සොහොනින් නැගිටුන, දෙවියන්වහන්සේගේම පුත්‍රයාගේ ත්‍යාගයේ පනිවිඩයයි. මෙහි සාධක දෙකක් ඔප්පු කරනු ලැබුවේය, එනම් උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා බවත්,

අපගේ ආදේශකයා ලෙස අප වෙනුවෙන් මරණය විඳීමේ වටිනාකමයි.

**රෝම1:4**

අපගේ පියවූ දෙවියන්වහන්සේගෙන්ද ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගෙන්ද අනුග්‍රහයත් සමාදානයත් නුඹලාට වේවා!

**රෝම 4:25**

උන්වහන්සේ වනාහි අපේ වරද නිසා පාවා දෙනු ලැබ, අප ධර්මිෂ්ඨකොට ගණන් ගනුලැබීම සඳහා නැගිටවනු ලැබූ සේක.

**2කොරින්ති5:21**

අප උන්වහන්සේ තුල දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම වන පිණිස පාපයක් නොදත්තාවූ උන්වහන්සේ අප වෙනුවට පාපය වෙන්ට (දෙවියන්වහන්සේ ) සැලැස්සූ සේක.

**1පේත්‍රුස්3:18**

මක්නිසාද දෙවියන්වහන්සේ ලඟට අප පමුණුවන පිණිස ධර්මිෂ්ඨවූ ක්‍රිස්තුස්වහන්සේ අධර්මිෂ්ඨයන් උදෙසා පව් ගැන වරක් දුක් වින්ද සේක. උන්වහන්සේ මාංශය සම්බන්ධයෙන් මරනු ලැබ, ආත්මය සම්බන්ධයෙන් ජීවත් කරනු ලැබූ සේක.




### අප දෙවියන්වහන්සේගේ පුත්‍රයා ලබන්නේ කෙසේද?

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කුරුසිය මත අප වෙනුවෙන් ඉෂ්ඨ කළ දෙය නිසා, කරයි. " පුත්‍රයාණන්වහන්සේ ඇත්තාට ජීවනය ඇත." යයි බයිබලය සඳහන් කරයි.

පුත්‍රයාණන්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පුද්ගලික ඇදහිල්ලෙන්, ක්‍රිස්තුස්වහන්සේ නම් පුද්ගලයා, අපේ පාප නිසාවූ උන්වහන්සේගේ මරණය, විශ්වාස කරමින් අපට පුත්‍රයා ලබාගැනීමට පුළුවන.

**යොහාන් 1:12**

නුමුත් යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝද, එනම් උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහාගත්තෝද, ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන් වෙන්ට උන්වහන්සේ බලය දුන් සේක.

**යොහාන්3:16-18**

මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය.

මක්නිසාද දෙවියන්වහන්සේ පුත්‍රයාණන් ලෝකයට එව්වේ ලෝකයා විනිෂ්චය කරන පිණිස නොව ලෝකයා උන්වහන්සේ කරණකොට ගෙන ගළවනු ලබන පිණිසය.

උන්වහන්සේ කෙරෙහි අදහාගන්නා විනිෂ්චය කරනු නොලැබේ. අදහානොගන්නා දෙවියන්වහන්සේගේ ඒක ජාතක පුත්‍රයාණන්ගේ නාමය කෙරෙහි අදහා නොගෙන සිටින බැවින් දැනටම විනිෂ්චය කරනු ලැබ සිටියි. මෙයින් කියන්නේ අප සැම කෙනෙක්ම එකම මගකින් දෙවියන්වහන්සේ වෙතට පැමිණියයුතු බවයි:

(1) පාපී බව හඳුනාගත් පව්කාරයෙක් ලෙස, (2) ගැළවීම තුල මනුෂ්‍ය ක්‍රියාකාරකම් ඵලක් නැති බව, සහ (3) අපේ ගැළවීම සඳහා මුළුමනින්ම ක්‍රිස්තුස්වහන්සේ මත රඳාපැවතිය යුතු බව ඇදහාගැනීමෙන් පමණක් බවත්ය.

ඔබේ පෞද්ගලික ගැළවුම්කරු ක්‍රිස්තුස්වහන්සේ බව පිළිගෙන විශ්වාස කිරීමට ඔබ කැමතිවන්නේ නම්, ඔබේ පව්කාර බව භාරගනිමින්, උන්වහන්සේගේ ක්ෂමාව පිළිගනිමින්, ඔබේ ඇදහිල්ල ක්‍රිස්තුස්වහන්සේ මත තබාගෙන, ඔබේ ගැළවීම සඳහා ඔබට සරල යාඥාවක් කළ හැක.

ඔබ ක්‍රිස්තුස්වහන්සේ තුල විශ්වාසය තබා ඇත්නම්, ඔබේ නව ජීවිතය ගැන ඉගෙනීමටත්, ස්වාමීන්වහන්සේ සමඟ ගමන් කරන්නේ කෙසේදැයි දැනගැනීමටත් අවශ්‍යය.

*ABCs for Christian Growth*. (කිතුණු වර්ධනය සඳහා හෝඩිය)නම් පාඩම් මාලාව ඉගෙනීම ආරම්භ කිරීම යෝජනා කිරීමට අප කැමැත්තෙමු. එය තුලින් ඉගෙනගනිමින් පියවරෙන් පියවර ඔබ දෙවියන්වහන්සේගේ වචනයෙහි සමහර මූලික සත්‍යතාවයන් තුලින් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබේ ඇහිල්ලෙහි ශක්තිමත් පදනමක් ගොඩනගාගැනීමට උපකාරී වනවා ඇත.